හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 28 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.
--------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ රු.1,516,794ක පොළ බදු බිල්කිරීම් ආදායම් හා වියදම් ගිණුමේ රු.1,129,023ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.387,771කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). 2014 ඔක්තෝබර් මස ස්ථිර කර තිබූ සේවකයින් 18 දෙනෙකුට වර්ෂය තුළ ගෙවා තිබූ රු.914,954ක වැටුප්, ප්‍රතිපූර්ණය කරගෙන නොතිබූ අතර ණයගැතියන් ලෙස ගිණුම්ගත කරද නොතිබුණි.

(ඇ). භෞතික සැලසුම් අංශයෙන් වැටුප් ප්‍රතිපූර්ණ රු.9,388,789ක් ආදායම් හා වියදම් ගිණුමේ වෙනත් ආදායම් යටතේ දැක්වීම නිසා එම වටිනාකමින් වෙනත් ආදායම් වැඩියෙන් හා වැටුප් ප්‍රතිපූර්ණ (වෙනත් ආධාර) අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). සේවා සඳහා ගාස්තු වශයෙන් ලද රු.500,761ක මුදලක් ආදායම් හා වියදම් ගිණුමේ බලපත්‍ර ගාස්තු යටතේ දැක්වීම නිසා එම වටිනාකමෙන් බලපත්‍ර ගාස්තු ආදායම වැඩියෙන් හා සේවා ගාස්තු ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). 2014 දෙසැම්බර් 31 දිනට රු.14,464,226ක දේශීය ණය හා සංවර්ධණ ණය අරමුදලේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.14,444,329ක් ලෙස දැක්වීම හේතුවෙන් ණය ප්‍රාග්ධනය රු.19,897කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ). 2014 දෙසැම්බර් බැංකු සැසඳුමේ සඳහන් මුදල් පොතේ සටහන් නොවූ ලැබීම් රු.291,285ක් මුදල් පොතේ සටහන්කර ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.

----------------------------

ගිණුම් විෂයයන් 04කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.79,037,247ක් වූ අතර, උපයෝගී ලේඛණ, වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.62,037,531ක් විය.

1.3.3 ශුද්ධ වත්කම්වල අඩුවීම.

----------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල අගය රු.103,096,026ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අගය රු.104,064,928ක් වූයෙන් ශුද්ධ වත්කම්වල පිරිහීම රු.968,902ක් බව නිරීක්ෂණය විය.

1.3.4 ලැබිය යුතු ගිණුම්

--------------------

2014 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.39,194,775ක් වූ අතර, ඒ තුළ වසරක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල වටිනාකම රු.14,112,067ක් විය. මෙම මුදල් මධ්‍යම රජයෙන් ලැබිය යුතු ප්‍රතිපාදන වන අතර ඒවා ලැබෙන බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.40,051,191ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.9,340,611ක් වී තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,580,613ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,390,754ක් විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමඟ සැසඳීමේදී රු.1,810,141ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2014 වර්ෂයේදී ආදායම් විෂයයන් 03ක ආදායම සියයට 13 සිට සියයට 28ක පරාසයකින් අඩුවීමත් වියදම් විෂයයන් 05ක වියදම සියයට 24 සිට සියයට 1080 දක්වා වූ පරාසයකින් වැඩිවීමත් හේතු වී තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් පරීක්ෂා කිරීමේ දි, ජංගම අනුපාතය 1:2:1 ක් වූ අතර එය ප්‍රශස්ථ මට්ටමට වඩා අඩුවෙන් පැවතින. ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ එම අගය 2:3:1ක ප්‍රශස්ථ මට්ටමක පැවතුණි. ජංගම වත්කම්වලින් සියයට 74 ක්ම හිඟහිටි කර්මාන්ත ආධාර වූ අතර ජංගම වගකීම්වලින් සියයට 74ක් කර්මාන්ත ණයහිමියන් විය.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | 2014.01.01 දිනට හිඟය | 2014 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ ලැබීම් 2014 වර්ෂයේ හිඟයෙන් | 2014 වර්ෂයේ බිල්කිරීම්වලින් | 2014.12.31 දිනට ශේෂ හිඟයෙන් | බිල්කිරීමෙන් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 1,812,947 | 1,888,916 | 494,764 | 954,277 | 1,318,183 | 934,639 | 2,235,517 |
| බදු කුලී | 1,019,919 | 1,073,465 | 85,022 | 543,921 | 934,897 | 529,544 | 1,464,441 |
| ජල ගාස්තු | 755,679 | 1,181,090 | 590,620 | 630,450 | 165,059 | 550,640 | 715,699 |
| මුද්දර ගාසතු | 3,758,386 | 4,149,120 | 2,150,155 | 1,291,703 | - | 2,857,417 | 2,857,417 |
| උසාවි දඩ | 480,710 | 974,202 | 472,706 | 374,622 | 9,004 | 599,580 | 607,581 |

### 2.4.2 වරිපනම් බදු

වර්ෂය ආරම්භයේ හිඟහිටි මුදලින් සියයට 27ක් හා වර්ෂයේ බිල්කිරීම්වලින් සියයට 50ක් වරිපනම් අයකරගෙන තිබූ අතර ආරම්භක හිඟයෙන් 1,237,211ක් ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.2,235,517ක හිඟයක් පැවතින. හිඟ වරිපනම් බදු අයකරගැනිමට ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.4.3 බදු කුලී.

සභාව සතු කඩකාමර බදුදීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,464,441ක ආදායමක් අයවිය යුතුව තිබුණ අතර බදුකරුවන් සභාව සමඟ විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

### 2.4.4 රථවාහන නවතා තැබීමේ ගාස්තු

සභා බලප්‍රදේශය තුළ කුලී රථ නවතා තැබීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබුණී. විවිධ කුලී රථ සඳහා රථගාල් නඩත්තු කර ඒ සඳහා ස්ථාන සළකුණු කර විධිමත්ව, බදු මුදලක් අයකරගැනීමට හැකියාව තිබියදීත් බලධාරීන්ගේ අකාර්යක්ෂමතාව නිසා එම ආදායම් අහිමිවී තිබුණි. මෙම කුලී රථ සඳහා 2014 වර්ෂය තුළ ලැබී තිබුණේ රු.9,600ක ආදායමක් පමණි.

### 2.4.5 ජල ගාස්තු.

2014 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තුව රු.715,699ක් වූ අතර එයින් වර්ෂයකට වඩා පැරණි හිඟ රු.165,059ක් විය. හිඟ ජල ගාස්තු අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

2.4.6 වෙළඳ බලපත්‍ර ගාස්තු
------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 07 ප්‍රකාරව සෑම වර්ෂයකම ආරම්භයේදී ආදායම් පරීක්ෂක/ හෝ සභාපතිවරයා විසින් විධිමත් සමීක්ෂණයක් මගින් සියළු ව්‍යාපාරිකයන්ගේ නම් බලපත්‍ර ලේඛනයට ඇතුළත් කර බලපත්‍ර ගාස්තු අයකළ යුතු වුවද, එම උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.4.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේක්ම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---:|
| උසාවි දඩ | 974,202 |
| මුද්දර ගාස්තු | 4,149,120 |
| | ------------ |
| එකතුව | 5,123,322 |
| | ======= |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.
-----------------------------------

(අ) 2008 දෙසැම්බර් 31 දින බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන රු.25,574ක හඳුනානොගත් වෙනස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 218 විධිවිධාන පරිදි සභාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව පරීක්ෂාකිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

සභාව කසළ කළමනාකරණය සඳහා වර්ෂ ගණනාවක සිට සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. 2014 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කසළවලට පස් දමා වසා දැමීමට රු.276,440ක වියදමක් දරා තිබුණි.

3.3 පාරිසරික ගැටළු
------------------
පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු ආයතන පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 සංයුක්ත සැළැස්ම
---------------------
සභාව සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

4.2 අයවැය පාලනය.
--------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට 07 සිට සියයට 766 දක්වාද වියදම් විෂයයන් 10ක සියයට 09 සිට සියයට 766 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ). විධිමත්ව මූල්‍ය ප්‍රතිපාදනවල අවශ්‍යතාව පිළිබඳව අධ්‍යනයකින් තොරව වැය ශීර්ෂ 09කට අධිප්‍රතිපාදන සලසා තිබූ අතර, වර්ෂය තුළදී ඌණ ප්‍රතිපාදන වෙන්කර තිබූ වැය විෂයය 15කට මෙම ප්‍රතිපාදන මාරුකර තිබුණි.

(ඇ). වැය ශීර්ෂ 07කට වෙන්කර තිබූ රු.960,000ක මුදලක් අදාළ කාර්යයන් ඉටු නොකර සම්පූර්ණයෙන් ඉතිරිකර තිබුණි.

(ඇ). අයවැය ලේඛණය මගින් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණ අවස්ථා 05කදී රු.356,062ක් වැයකර තිබුණි.

4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
--------------------------------
සමාලෝචිත වර්ෂය තුළදී රු.46,723,606ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4:2 උප පරිච්ඡේද ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් භාවිත කර නොතිබුණි.

4.4 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/01 දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). අභ්‍යන්තර පාලනය

(ඇ). ආදායම් පරිපාලනය

(ඈ). ණයගැති ණයහිමි පාලනය.